(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 72. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 අගෝස්තු 05 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නිශාන්ත ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 ජූලි මස 25 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**
**Democratic Socialist Republic of Sri Lanka**

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2025 අගෝස්තු 04 දින 'සමාගම් (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**II**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් 2025 ජූලි 25 දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLV කොටස; සහ

(ii) 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ III හා IV කොටස් සහ නවවැනි කාණ්ඩයේ I කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය

(2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(ii) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

ඉදිරිපත් කර, එම යෝජනා සම්මතය, නියමය සහ නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 1988 අංක 83 දරන පනතින් සංශෝධිත, රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) 10(අ) වගන්තිය යටතේ ආනයනික භාණ්ඩ සඳහා තීරු බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ, මුදල් කොමිෂන් සභාවේ, විගණන සේවා කොමිෂන් සභාවේ, මැතිවරණ කොමිෂන් සභාවේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා 2025 ජූලි 08 අඟහරුවාදා හා 2025 ජූලි 09 බදාදා පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද වාර්ෂික කාර්ය සාධන වාර්තා හය රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත නොව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126 ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබිය යුතු යැයි යනුවෙන් සභාවේ අවසරය ඇතිව සංශෝධනය විය යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ සහ 35(1), (2), සහ (4) වගන්ති සමඟ කියවිය යුතු 58 වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) පරිසර අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය විසින් 2024 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනතේ 7(1) සහ 8(2) වගන්ති සමඟ කියවිය යුතු 15 වගන්තිය යටතේ නියෝග (2023 අගෝස්තු 05 දිනැති අංක 2343/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද);

(iii) සංශෝධිත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම සම්බන්ධයෙන් නියමය (2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද);

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යතිරේකය සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 19, 20, 21, 22 සහ 23 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ නියෝග (2025 ජුනි 30 දිනැති අංක 2443/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(v) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ නියමය (2025 ජුනි 18 දිනැති අංක 2441/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද)

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) තිහාරිය, වාරණ පාර, සිරි නිවස, අංක 238/3 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. උදේනි උමේන්ද්‍ර වීරසිංහ මහතාගෙන් ලැබුණු 2025.03.04 දිනැති පෙත්සම; සහ

(ii) යක්කල, අලුත්ගම, බෝගමුව, පල්ලිය පාර, අංක 125/8 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. පී. සී. රත්නායක මහත්මියගෙන් ලැබුණු 2025.05.02 දිනැති පෙත්සම

ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අතුරුගිරිය, පෝරේ, සීලවිමල මාවත, අංක 208/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඒ.එච්.එල්. මාටින් සිංඤෝ මහතාගෙන් ලැබුණු 2025.03.17 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය විසින් පිළිගන්වන ලදී.

(3) මුගුණුවටවන, කන්ජුක්කුලිය, බතල හේන වත්ත, අංක 81/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඔගස්ටින් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2025.03.22 දිනැති පෙත්සම ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(4) මීරිගම, තවලම්පිටිය, 2 වන පටුමග, මඩුගහවත්ත යන ස්ථානයෙහි පදිංචි වයි. එම්. සී. පොඩිමැණිකේ මහත්මියගෙන් ලැබුණු 2025.02.05 දිනැති පෙත්සම ගරු අමිල ප්‍රසාද් මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) යටියන්තොට, වත්ත පාර, මීපිටිකන්ද යන ස්ථානයෙහි පදිංචි ඩී. ජී. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු 2025.05.09 දිනැති පෙත්සම;

(ii) මාලඹේ, කහන්තොට, මල්වත්ත පාර, අංක 228/2ඕ/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.බී.අයි.සී. සේසත් බණ්ඩාර මහත්මියගෙන් ලැබුණු 2025.03.24 දිනැති පෙත්සම;

(iii) හාලි ඇළ, නුගසෙවණගම, කොබ්බෑකඩුව මාවත, අංක 4 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්. එම්. රණතුංග මහතාගෙන් ලැබුණු 2025.05.12 දිනැති පෙත්සම; සහ

(iv) හෝමාගම, දූවවත්ත, නො. 27/18 දරන ස්ථානයෙහි පදිංචි වයි. කේ. ජී. ඩී. බී. යටිවැල්ල මහතා සහ වෙනත් හයදෙනෙකුගෙන් ලැබුණු 2025.02.15 දිනැති පෙත්සම

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා විසින් පිළිගන්වන ලදී.

(6) දිවුලපිටිය, වැවගෙදර, අංක 239/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. සිරිසිංහ මහතාගෙන් ලැබුණු 2025.06.14 දිනැති පෙත්සම ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය විසින් පිළිගන්වන ලදී.

(7) හංවැල්ල, පහත්ගම, අංක 82/3 දරන ස්ථානයෙහි පදිංචි එන්. ප්‍රසන්න ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.05.16 දිනැති පෙත්සම ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. වරප්‍රසාද:** ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු චතුර ගලප්පත්ති මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 මැයි 09 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය:** ගරු කථානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ 2025.04.08 දිනැති න්‍යාය පත්‍රයේ සඳහන් අංක පා.29/2025 දරන යෝජනා සම්මතය 2025 අප්‍රේල් 08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, එකී යෝජනාවේ ඇතුළත් චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂා කොට, සිය සොයාගැනීම් වාර්තා කරනු පිණිස 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5(2) වන වගන්තිය සහ 6(ආ) වන වගන්තිය යටතේ (මෙහි මින් මතු "කමිටුව" නමින් සඳහන් කරනු ලබන) පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබූ හෙයින් ද;

එකී පනතේ 8(1)(ආ) වගන්තිය ප්‍රකාරව එකී කමිටුව විසින් කරුණු සොයා බලා, සිය තීරණ කථානායකවරයා වෙත 2025.07.21 දින දැනුම් දී තිබූ හෙයින් ද;

එම තීරණ ඇතුළත් වාර්තාව කථානායකවරයා විසින් 2025.07.22 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරනු ලැබූ හෙයින් ද;

කමිටුව සිය පරීක්ෂණය පවත්වා, ඉහත කී සභාගත කරන ලද වාර්තාවට අමුණා ඇති චෝදනා පත්‍රය තුළ පොලිස්පතිවරයාට එරෙහිව නගන ලද මුළු චෝදනා 23 අතරින් චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 13, 14, 15, 16, 17, 18, 19, 22 සහ 23 සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වරදකරු බව තීරණය කර ඇති හෙයින් ද;

පරීක්ෂණ කමිටුව විසින් වාර්තාගත කරන ලද සහ මෙම සභාවේ සභාගත කරන ලද එකී වාර්තාවේ සඳහන් වරදකරු බවට වන තීරණ පදනම් කර ගනිමින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(3) ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අ.භා. 12.17 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.49 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.12 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.53 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 177; විරුද්ධව 0; වැළකී සිටීම් 1; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හැත්තෑපස්දෙනෙකු (175) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 024. Nihal Galappaththi | Yes |
| G 025. Nihal Abeysinghe | Yes |
| G 026. Namal Karunaratne | Yes |
| G 027. Wasantha Piyathissa | Yes |
| G 028. Gamagedara Dissanayake | Yes |
| G 029. R.M. Jayawardhana | Yes |

| | |
|---|---|
| G 030. Sunil Watagala | Yes |
| G 031. Rathna Gamage | Yes |
| G 032. Mahinda Jayasinghe | Yes |
| G 033. Chathuranga Abeysinghe | Yes |
| G 034. Eranga Gunasekara | Yes |
| G 035. Upali Samarasingha | Yes |
| G 036. T.B. Sarath | Yes |
| G 037. Nalin Hewage | Yes |
| G 039. Anton Jayakody | Yes |
| G 040. Sundaralingam Pradeep | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Ruwan Ranasinghe | Yes |
| G 043. Muneer Mulaffer | Yes |
| G 044. Susil Ranasinghe | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Ashoka Ranwala | Yes |
| G 055. Lakshman Nipuna Arachchi | Yes |
| G 056. R.M. Gamini Rathnayake | Yes |
| G 057. Manjula Suraweera Arachchi | Yes |
| G 058. K. Ilankumaran | Yes |
| G 059. Shantha Pathma Kumara Subasingha | Yes |

| | |
|---|---|
| G 060. Samanmali Gunasingha | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Ajith Agalakada | Yes |
| G 063. Sagarika Athauda | Yes |
| G 064. Roshan Akmeemana | Yes |
| G 066. L.M. Abeywickrama | Yes |
| G 067. M.K.M. Aslam | Yes |
| G 068. Kaushalya Ariyarathne | Yes |
| G 069. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 070. Arkam Ilyas | Yes |
| G 071. Oshani Umanga | Yes |
| G 072. Krishnan Kalaichelvi | Yes |
| G 073. Upul Kithsiri | Yes |
| G 074. Wasantha Pushpa Kumara | Yes |
| G 075. Chaminda Lalith Kumara | Yes |
| G 076. Sarath Kumara | Yes |
| G 077. Nilanthi Kottahachchi | Yes |
| G 078. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 079. Lasith Bhashana Gamage | Yes |
| G 080.Thilanka U. Gamage | Yes |
| G 081. Nilusha Lakmali Gamage | Yes |
| G 082. Ajantha Gammeddage | Yes |
| G 084. Jagath Gunawardana | Yes |
| G 085. Aboobucker Athambawa | Yes |
| G 086. Ruwanthilaka Jayakody | Yes |
| G 087. Thushari Jayasingha | Yes |
| G 088. T.K. Jayasundara | Yes |
| G 089. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 091. Sellaththamby Thilaganathan | Yes |

| | |
|---|---|
| G 092. Anushka Thilakarathne | Yes |
| G 093. Chandana Thennakoon | Yes |
| G 094. Thanura Dissanayake | Yes |
| G 095. Dharmapriya Dissanayake | Yes |
| G 096. Sujeewa Dissanayake | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Susantha Dodawatta | Yes |
| G 099. Susantha Kumara Nawarathna | Yes |
| G 100. Sena Nanayakkara | Yes |
| G 101. Najith Indika | Yes |
| G 102. Aruna Panagoda | Yes |
| G 103. Nimal Palihena | Yes |
| G 104. Nishantha Perera | Yes |
| G 105. Stepni Fernando | Yes |
| G 106. Kanthasamy Prabu | Yes |
| G 107. Lal Premanath | Yes |
| G 108. Nanda Bandara | Yes |
| G 109. Padmasiri Bandara | Yes |
| G 110. Ravindra Bandara | Yes |
| G 111. Sudath Balagalla | Yes |
| G 112. Sri Bavanandarajah | Yes |
| G 113. E. M. Basnayaka | Yes |
| G 114. Wijesiri Basnayake | Yes |
| G 115. Lakmali Hemachandra | Yes |
| G 116. S. Sandaruwan Madarasinghe | Yes |
| O 001. Mano Ganeshan | Yes |
| O 007. Gayantha Karunathilleka | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | Yes |

| | |
|---|---|
| O 015. G.G. Ponnambalam | Yes |
| O 016. Ramanathan Archchuna | Abstain |
| O 017. M.A.M. Thahir | Yes |
| O 019. Sivagnanam Shritharan | Yes |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | Yes |
| O 022. Harsha de Silva | Yes |
| O 027. J. C. Alawathuwala | Yes |
| O 029. Hector Appuhamy | Yes |
| O 039. Kaveenthiran Kodeeswaran | Yes |
| O 040. Gnanamuththu Srineshan | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 057. M.S. Uthumalebbe | Yes |
| O 058. Abthul Wazeeth | Yes |
| O 059. Kathiravelu Shanmugam Kugathasan | Yes |
| O 060. Thurairasa Ravikaran | Yes |
| O 063. Ismail Muththu Mohamed | Yes |
| O 064. Nissam Kariyappar | Yes |
| O 065. Prageeth Madhuranga | Yes |
| O 066. Jagath Manuwarna | Yes |
| O 067. Ruwan Mapalagama | Yes |
| O 068. Nandana Millagala | Yes |
| O 069. Riyas Farook | Yes |
| O 070. Danushka Ranganath | Yes |
| O 071. Sanjeewa Ranasingha | Yes |
| O 072. Sunil Rathnasiri | Yes |
| O 079. Elayathamby Srinath | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | Yes |
| O 081. Manjula Sugath Rathnayaka | Yes |
| O 082. A.M.M.M. Rathwaththe | Yes |

| | |
|---|---|
| O 083. Manoj Rajapaksha | Yes |
| O 084. Sunil Rajapaksha | Yes |
| O 085. Hasara Liyanage | Yes |
| O 086. Deepthi Wasalage | Yes |
| O 087. Kanchana Welipitiya | Yes |
| O 088. R. G. Wijerathna | Yes |
| O 089. Nishantha Samaraweera | Yes |
| O 090. Priyantha Wijerathna | Yes |
| O 091. Ruwan Wijeweera | Yes |
| O 092. Darmapriya Wijesinghe | Yes |
| O 093. Hiruni Wijesinghe | Yes |
| O 094. Athula Welandagoda | Yes |
| O 095. Fasmin Sharif | Yes |
| O 096. Dinindu Saman | Yes |
| O 097. Thilina Samarakoon | Yes |
| O 098. Ambika Samivel | Yes |
| O 099. Dewananda Suraweera | Yes |
| O 100. Chandana Sooriyaarachchi | Yes |
| O 101. G.D. Sooriyabandara | Yes |
| O 102. Aravinda Senarath | Yes |
| O 103. Kitnan Selvaraj | Yes |
| O 104. Janaka Senarathna | Yes |
| O 105.Chandima Hettiaratchi | Yes |
| O 106. Champika Hettiarachchi | Yes |
| O 107. Dinesh Hemantha | Yes |
| O 108. Geetha Herath | Yes |
| O 109. Bhagya Sri Herath | Yes |
| O 110. Muhammad Faizal | Yes |
| O 111. Ashoka Gunasena | Yes |

| | |
|---|---|
| O 112. Nandana Pathmakumara | Yes |
| O 113. Sunil Biyanwila | Yes |
| O 114. Samantha Ranasingha | Yes |
| O 115. Nishantha Jayaweera | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දෙදෙනෙකු (02) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Rishad Bathiudeen | Yes |
| M.L.A.M. Hizbullah | Yes |

**9. ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග:** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ 64, 65, 66, 69 සහ 70 වගන්ති සමඟ සහ 45(5) වගන්තිය සමඟ කියවිය යුතු 84 වගන්තිය යටතේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අ.භා. 4.19 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය යුතු ය"යි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.10 ට ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග:** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා වෙනුවෙන් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූනි 04 දිනැති අංක 2439/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැසට් කිරීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරිය විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 අගෝස්තු 06 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.